**ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් (පුද්ගලික) සමාගම- 2021**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්ර්කාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපළ පිරියත හා උපරකරණ වලට අදාල ජංගම නොවන වත්කම් ගිණුම් සහ එම වත්කම් වලට අදාල ක්ෂය වෙන්කිරීමේ ගිණුම් ද පොදු ලෙජරය තුළ නිරූපණය නොවූ අතර ශේෂ පිරික්සුම තුළද එම අගයන් දක්වා නොතිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳව නිවැරදි කරමි. | පොදු ලෙජරය නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම සතු පිරිවැය රු.5,366,485 ක් වූ දේපළ, පිරියත හා උපකරණ වල ඵලදායී ආයු කාලය අවසන් වී පැවතියද විගණිත වර්ෂය තුළදී ද එම වත්කම් භාවිතා කරනු ලබන බවට විගණනයේදී නිරීක්ෂණය විය. මේ අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 17 වන කොටසේ ඡේද අංක 17.1.9 අනුව එම වත්කම් වල ඵලදායී ජීව කාලය නිවැරදිව ඇස්තමේන්තු ගත කර නොමැති බව නිරීක්ෂණය විය. | සමාගමේ වර්තමාන මූල්‍ය තත්ත්වය අනුව වත්කම් තක්සේරු කිරීම හා ප්‍රත්‍යාගණනය වෙනුවෙන් වියදම් දැරීම අපහසු තත්ත්වයක් ඇත. නමුත් මෙය ඉතා අත්‍යවශය කාර්යයක් වන බැවින් ඉදිරියේදී මෙම කටයුතු අවසන් කිරීමට කටයුතු කරමි. | අදාල ප්‍රමිතීන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2012 වර්ෂයේදී රු.2,500,000 ක පිරිවැයකට අගය කර තිබූ අංක GG-9396 දරන කැබ් රථය සමාගම විසින් භාවිතා කරනු ලැබුව ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 2 වන කොටසේ ඡේද අංක 19 අනුව 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ අදාල වත්කම හෙළිදරව් කර නොතිබුණි. | මෙම කැබ් රථය ලේකම්, පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කැබ් රථයක් වන අතර එය සමාගමට පවරා ගත් පසු වත්කම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 23 වන කොටසේ 23.14 වගන්තිය යටතේ ආදායමක් ලෙස හඳුනා ගැනීමට නොහැකි රු.248,482 ක ආදායමක් මෙහෙයුම් ආදායම් යටතේ දක්වා තිබුණි. | මෙම සේවාව මේ දක්වා ඉටු කර නොමැති අතර මධ්‍යම පරිසර අධිකාරිය මේ පිළිබඳව අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය කරමි. එබැවින් මේ පිළිබඳව තව දුරටත් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත වල 10 වන කොටසේ 10.21 (අ) වගන්තිය අනුව පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීමේදී මූල්‍ය ප්‍රකාශන තුළ පෙර වර්ෂයට අදාල සංසංදනාත්මක තොරතුරු ද නැවත නිවැරදි ලෙස ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණ ද සමාගම විසින් 2020 වර්ෂයේ වැරදි නිවැරදි කිරීමට අදාල ගෙවිය යුතු පාරිතෝෂික සහ ගෙවිය යුතු විගණන ගාස්තු අගයන් නිවැරදි කර ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල ගිණුම් පිළියෙළ කිරීමේදී මෙවැනි ගනුදෙනු සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයට අදාල දායක මුදල් ගෙවීම ප්‍රමාදවීම මත සේවක අර්ථසාධක අරමුදල සඳහා සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත පිළිවෙලින් ගෙවියයුතු අධිභාරය රු.259,600 ක් හා රු.29,205 ක් නිවැරදිව | ඉදිරි වර්ෂවල ගිණුම් පිළියෙළ කිරීමේදී මෙවැනි ගනුදෙනු සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර වියදම් පාලනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | KJ-4483 මෝටර් රථයේ වාර්ෂික රක්ෂණ මුදල ලෙස රු.43,873 ක මුදලක් 2021 ජූලි 01 දින ගෙවා තිබූ අතර එයින් 2022 වර්ෂයට අදාල රු.14,664 ක මුදල උපචිත පදනම යටතේ ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස කපාහැර තිබුණි. | මෙවැනි ගනුදෙනු ඉදිරි වර්ෂවලදී නියමිත පරිදි වාර්තා කිරීමට කටයුතු කරමි. | උපචිත පදනම මත ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රතීතණ මණ්ඩලය (Accreditation Board) වෙත 2021 ජූලි 01 දින 2021/2022 වර්ෂ සඳහා වාර්ෂික ප්‍රතීතණ ගාස්තු වෙනුවෙන් ගෙවා තිබූ රු. 150,000 ක සම්පූර්ණ මුදලින් රු.129,863 ක් පමණක් 2021 වර්ෂයට අදාල වුවද එම මුළු මුදල සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙවැනි ගනුදෙනු ඉදිරි වර්ෂවලදී නියමිත පරිදි වාර්තා කිරීමට කටයුතු කරමි. | උපචිත පදනම මත ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | සමාගමේ කාර්යාලය 2023 වර්ෂයේදී පරිසර අමාත්‍යාංශ පරිශ්‍රයේ ස්ථාපනය කිරීමට පෙර දැව සංස්ථාවේ ස්ථාපනය කර තිබූ නමුත් 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කාර්යාල කුලිය රු.1,415,849 ක් දැව සංස්ථාව වෙත ගෙවා නොතිබුණි. එසේම 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් මේ සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු අතර ගිණුම්කරණ සටහන් මඟින් ද හෙළිදරව්කර නොතිබුණි. | සමාගමේ මූල්‍ය තත්වය මත මෙම මුදල් නිරවුල් කිරීමට මේ දක්වා නොහැකි වී ඇති නමුත් ඉදිරියේදි මෙය ගෙවීමට කටයුතු කරමි. | වගකීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ 2020 වර්ෂයේ අවසන් දිනට මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම රු.10,071,017 ක් වුවද 2021 වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ වල ආරම්භක ශේෂය ලෙස රු.71,017 ක් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ස්ථාවර තැන්පතුව මුදල් හා මුදල් සමාන දෑ යටතේ වාර්තා කර තිබූ අතර 2021 වර්ෂයේදී එම ස්ථාවර තැන්පතුව ජංගම නොවන වත්කම් යටතේ වාර්තා කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ 2021 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් ලෙස රු.702,500 ක් ගැලපීම් සිදු කර තිබුණි. | පසු ගිය විගණන නිරීක්ෂණ අනුව මෙම ගැලපීම සිදු කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ආදායම | - | 2021 වර්ෂයට අදාලව අවලංගු කර ඇතැයි පැවසූ ඉන්වොයිස් 07 ක් විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොකළ අතර එම ඉන්වොයිසි අවලංගු කිරීම සඳහා හේතුව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. සමාගම විසින් ආදායම් රැස් කිරීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණු අතර ඒ අනුව සමාගම විසින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති රු.7,124,960 ක ආදායමේ නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය. | 2021 වර්ෂයේ අවලංගු කරන ලද ඉන්වොයිස් 07 ක පිටපත් විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලද අතර ඉදිරිපත් කරන ලද ඉන්වොයිස් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇත. | සියළු ආදායම් ගිණුම්ගත වීම තහවුරු වන පරිදි විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර යවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) | කාර්ය සාධනය | - | සමාගමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිබඳ තොරතුරු 2023 ජූලි 27 දින විගණනය වෙත ලබාදෙන ලෙස දන්වා සිටියද 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය අනුව විගණන කටයුතු සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව 2021 මූල්‍ය වර්ෂයට අදාල මූල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිබඳ විගණන විෂය පථය සීමා වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16(1) වගන්තිය | සේවා යෝජක විසින් සෑම මසකටම අදාළව සේවා නියුක්තිකයන්ගේ දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට ප්‍රථම මණ්ඩලය වෙත යොමු කළ යුතු වුවත් සමාගම විසින් දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.15,723 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි. | මෙම ප්‍රමාදයන් ඉදිරියේ දී වලක්වා ගැනිමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 120(ඒ) කොටස | සේව්‍යයා විසින් සේවකයින්ගෙන් උපයන විට බදු ගෙවීම ලෙස මාසිකව අඩුකරගන්නා ලද මුදල ඊළඟ මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු වුවද 2015, 2016 හා 2017 වර්ෂවලට අදාලව උපයන විට බදු ලෙස ගෙවිය යුතුව තිබූ රු.326,000 ක මුදල පිළිවෙලින් වර්ෂ 8,7 ක් හා 6 ක් පමණ ප්‍රමාද වී 2023 සැප්තැම්බර් 14 දින දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර තිබුණි. | මෙම සියලු ගෙවීම් මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා අවසන් කර ඇති අතර වර්තමාන ගෙවීම් ප්‍රමාදයකින් තොරව නිසි පරිදි සිදු කරනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2007 අංක 07 දරන සමාගම් පනත | | | |
| (i) | 131(1) වගන්තිය | i. සෑම සමාගමක්ම පස්වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කාරණා ඇතුළත් වාර්ෂික වාර්තාවක්, යටත් පිරිසෙන් සෑම වර්ෂයකටම වරක් නියමිත ආකෘතියෙහි රෙජිස්ටාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු වුවද සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ වන විට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් වාර්ෂික වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 223(1) වගන්තිය | ii. මෙම වගන්තිය ප්‍රකාර සමාගම විසින් අධ්‍යක්ෂකවරයන් හා ලේකම්වරයන් පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iii) | 223 (2) වන උප වගන්තිය (අ) , (ආ) | ii. 2020 හා 2021 වර්ෂයන්හි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය හා ලේකම්වරු වෙනස් වී තිබුණද මෙම වගන්තිය ප්‍රකාරව එම වෙනස ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකෘතියට අනුව රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සමාගම් ලේකම්වරයා විසින් කටයුතු කරගෙන යනු ලැබේ. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය | | | |
| (i) | මාර්ගෝපදේශ අංක 2.3 | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම සමඟ ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට උපායමාර්ගික සැලැස්ම රාජ්‍ය ව්‍යාපර දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ අනුව කටතු කල යුතුය. |
| (ii) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 2 | මෙහෙයුම් අත්පොතේ 2 ඡේදය ප්‍රකාරව සමාගම විසින් මෙහෙයුම් පද්ධති සහ පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත අනුව කටයුතු කල යුතුය. |
| (iii) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 6.7 | සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳව කටයුතු කරනු ඇත. | චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.3 | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලික කාර්යසාධන දර්ශක (KPI) අනුමත ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය සමඟ (KPI) කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි. | කාර්ය සාධන දර්ශක සකස් කර සංයුක්ත සැලැස්මට ඇතුළත් කර ඇති අතර ඉදිරියේදී සමාලෝචනයට ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත අනුව කටයුතු කල යුතුය. |
| (v) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.4 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය, කාරක ප්‍රාග්ධනය, මුදල් ප්‍රවාහයන්, ද්‍රවශීලතා මට්ටම සහ ණය තත්ත්වයට (Debt Position) අදාල වාර්තාවන් මාසිකව පරීක්ෂා කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත අනුව කටයුතු කල යුතුය. |
| (vi) | මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.5 | සමාගම විසින් මාසිකව, කාර්තුමය හා වාර්ෂිකව පිළියෙළ කරනු ලබන කාර්ය සාධන වාර්තා මහා භාණ්ඩාගාරයට යොමු කර නොතිබුණි. | මෙම වාර්තාව අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත අනුව කටයුතු කල යුතුය. |
| (ඉ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු වේ 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 6.6 | කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා අවසන් ගිණුම් මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් මාස 20 ක් ප්‍රමාද වී එනම් 2023 ඔක්තෝබර් 30 වන දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී වාර්ෂික වාර්තාවන් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ අනුව කටතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 196,388 ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අලාභය රු. 771,256 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 967,644 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාගමේ මෙහෙයුම් ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් රු.209,000 කට මිලදී ගෙන ඇතැයි සඳහන් වායු සමීකරණ යන්ත්‍රයක් මීට ඉහත සමාගම් කාර්යාලය පිහිටි ගොඩනැඟිල්ලේ සවිකර ඇති බව සඳහන් කර ඇති අතර එම වායු සමීකරණ යන්ත්‍රය වර්තමානයේදී සමාගමේ කටයුතු සඳහා උපයෝජනය නොකරන බව නිරීක්ෂණය විය | මෙම වායු සමීකරණ යන්ත්‍රය මීට ඉහත දී සමාගමේ කාර්යාලය තිබූ ගොඩනැගිල්ලේ සවි කර ඇත. එම ගොඩනැගිල්ලෙන් ඉවත් වීමෙන් පසුව වායු සමීකරණ යන්ත්‍රය ලබා ගැනීමට කටයුතු කරන ලද නමුත් එය ලබා ගැනීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී මෙය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | වත්කම් උපරිම ධාරිතාවයෙන් උපයෝජනය කල යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ රු.125,000 ක පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 හි අපේක්ෂිත අරමුණ වන ප්‍රසම්පාදනයේ ආර්ථිකබව, කාලෝචිත බව සහ ගුණාත්මකභාවය උපරිම කිරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙම ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ කාර්යමණ්ඩලය 08 දෙනෙකු වුවත් සමාගමේ බඳවා ගැනීමේ පටිපාටිය හෝ කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපායමාර්ගික සැලැස්ම අනුමත වීමෙන් පසුව කාර්ය මණ්ඩලය අනුමත කිරීමට කටයුතු කරනු ලැබේ. | බඳවාගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |